**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව - 2020**

**----------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 3,236,917 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | දැනට වත්කම් කේත කිරීම සිදු කරමින් පවතින අතර එය අවසන් වූ වහාම සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කලයුතු වීම. |
| (ආ) 2018 හා 2019 වර්ෂවලදී ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබූ වෙබ් අඩවිය සඳහා දරන ලද රු.614,800ක පිරිවැය සමාලෝචිත වර්ෂයේදි අස්පෘෂ්‍ය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනවා වෙනුවට වියදමක් ලෙස කපා හැර තිබුණි. | වියදමක් ලෙස සටහන් වී ඇති වෙබ් අඩවිය සඳහා දරන ලද පිරිවැය වත්කමක් ලෙස ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් ගතකල යුතු වීම. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) | අතුරු අග්‍රිමයන් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් වීමෙන් පසු දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමයන් පියවිය යුතු වුවද , සමාලෝචිත වර්ෂයේදි නිලධාරින් 04දෙනෙකු සඳහා ලබා දී තිබූ අතුරු අග්‍රිම රු. 247,350ක් පියවීමට දින 15 ක සිට දින 146 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයක් නිරික්ෂණය විය. | කොරෝනා වෛරස් තත්වය හේතුවෙන් වාර්තාවේ පෙන්වාදී ඇති අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයක් සිදුවී ඇත. ඉදිරියේදී මෙම තත්වය වලක්වාගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) මුදල් රෙගුලාසි 396 | 2020 දෙසැම්බර් 31 දින දක්වා නිකුත් කරන ලද මාස 06 ඉක්ම වු රු. 71,053 ක් වටිනා චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් විගණිත දිනය දක්වාම රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට අදාල බලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6 ඡේදය | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවන් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ සහතික විය යුතු වුවද, 2020 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සැලසෙන පරිදි 2021 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,835,397 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,154,704 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,319,307 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ආදායම රු 4,099,102 කින් අඩු වුවද, මුළු වියදම රු 6,418,408 කින් අඩු වීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013, 2014 හා 2015 යන වර්ෂවල වාර්ෂික වාර්තා හා සීඩී තැටි මුද්‍රණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදි රු. 1,395,197 ක වියදමක් දරා තිබුණි. මෙම වියදම දැරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) , 3.4.2 (අ) හා 6.3.6 යන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව කටයුතු කර තිබුණි. | කොමිෂන් සභාවෙන් ප්‍රසම්පාදන කාර්යය පිළිබඳ අදාල නිලධාරියාට අවශ්‍ය පුහුණුව සහ උපදෙස් ලබාදී වාර්තාවේ ඇති දෝෂයන් නිවැරදි කිරීම ට කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි කටයුතු කල යුතු වීම. |